# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2360/36 - 2023 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා - 2023.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2010

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්, 2021 සැප්තැම්බර් මස 6 වන දින අංක 2244/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසන්වරට සංශෝධනය කරන ලද, 2014 ජනවාරි මස 30 වන දින අංක 1847/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (4) වන ඡේදය, " ව්‍යාපෘතිය, 2022 දෙසැම්බර් මස 31 වැනි දින වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" ව්‍යාපෘතිය -

(අ) 2021 නොවැම්බර් මස 30 වන දින I වන අදියර (නව) සම්පූර්ණ කරනු ලැබ ඇත ; සහ

(ආ) 1 වන ගොඩනැගිල්ල (සම්මන්ත්‍රණ ශාලාව සහ රථ ගාල), 2 වන ගොඩනැගිල්ල (හෝටලය) සහ 3 වන ගොඩනැගිල්ල (සිල්ලර අලෙවිහල) ඇතුළත් වන II වන අදියර (නව) 2023 දෙසැම්බර් මස 31 වන දින සම්පූර්ණ කරනු ලැබිය යුතු ය".

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0323


1A - PG 6540 - 291 (2023/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*